## කෙටි කතාව

වීරවංශ බස් නැවතුම්පලෙන් එලියට පැමින පාර දෙස බැලීය. ඒ සමගම කාටවත් නොදැනෙන ලෙස බස් නැවතුමේ සිට මගීන් දෙසද විමසිලිමත් දෑසින් බලන්නට වූවේය. ඔහුගේ ඉලක්කය වූයේ මගීන් අතර සිටි කාන්තාවන්ය. තමන්ගේ බලාපොරොත්තුව නිශ්ඵල වූ කල වීරවංශ නැවතත් තමා පෙර සිටි ස්ථානය වෙත ආපසු ගියේය.

"කබ්රාල් එහෙනං මට බොරුවක්ද කීවේ." වීරවංශ තමාගෙන්ම අසා ගත්තේය. ඒ සැනින්ම ඔහු එම මතය සිතින් ප්‍රතික්ෂේප කර දැමුවේය. කාර්යාල කාර්ය්‍ය සහායකයා තමන්ට කවමදාවත් බොරු නොකරන බව වීරවංශට ඉර හඳ මෙන් විශ්වාසය. කබ්රාල්ගේ හඬ ඔහුට නැවත නැවත ඇසෙන්නාක් මෙන් දැනිනි.

මොනවද සෑර් ඔය ස්ටෑන්ඩ් එකට එනවා තෙල් කෑලි වගේ ඒවා. හරියට ඉට්රූප වගේ. මේ එනවා. මේ යනවා. හරියට පැණිදෙණිය බස් ගහනවා වගේ. ඕන්න සර් අදුනාගන්න හරිම ලේසියි. හොඳට ඇඳලා පැලඳලා ඉන්නේ. මූනේ මේකප් එක ටිකාක් වැඩියි වගේ පේනවා. තව කරේ හෑන්ඩ් බෑග් එකක් තියෙනවා. මොන මොනවා හරි දාගත්තු පොලිතින් කවරෙකුත් තියෙනවා. හැම වේලෙම බස් එකක් ගැන සෝදිසියෙන් ඉන්නේ. ඒත් ඉතිං ඒ බස් එක නම් කවදාවත්ම එන්නෙ නැති එකක්.

ඒ සමගම කබ්රාල්ගේ හාස්‍යජනක හිනාව.

පාරේ එහා කෙලවරේ සිට ලැසි ගමනින් එන තරුණියක් දෙසට වීරවංශගේ දෙනෙත් යොමු වුනේ නිතැතිනි. ඔහු වහාම මෙතක් වේලා අල්වාගෙන උන් බස් නැවතුමේ අත් වාරුව අතහැර දමා සෘජුව සිට ගත්තේය. ඔහු ඇය දෙස උවමනාවෙන් බැලීය. දන හිසට මදක් කෙටි වන්නට ඉහලින් හැද ඇති කෙටි සායත්, ඊටම ගැලපෙන සිහින් උරහිස් පටි දෙකකින් සමන්විත උඩුකය වැස්මත් ඇයට මනාව ගැලපෙන්නේ යැයි වීරවංශට සිතිනි. සුදු පැහැයට ආසන්නව ඇති තලෙලු පැහැයක් හිමි ඈ තොල් දම් පැහැයට හුරු රතෙන් වර්න කර තිබිනි. අඩක් නිරාවරනය වී ඇති ඇගේ ලැම හුස්ම ගන්නා විට ඉහල පහල යන අන්දම දෙස වීරවංශ බලා සිටියේ මහත් ආසාවෙනි. කෙටි සාය නිසා නිරුවත් වී ඇති ඇගේ දග යුගල දෙසද ඔහුගේ අතෘප්තිකර දෑස් වෙහෙස විය. කිටි කිටියේ ඇද තිබූ කෙටි සාය නිසා ඇගේ නිතඹ තෙරපී ඇති අන්දම ඔහුගේ දෑසට රසඳුනක්ම විය.

"කබ්රාල්ගේ දූත ලක්‍ෂන නම් සේරම හරි. ඒත් ඉතිං මෙයත් එක්ක කථා කරන්නේ කොහොමද ?" වීරවංශ මදක් කල්පනා කලේය. ඔහු නැවත නැවත ඇගේ තුරුණු රූ සපුව දෑසින් වින්දනය කලේය. සිතින් ඇගේ සියලු රෙදි පෙරෙදි උනා දැමුවේය. තමාගේ සිත මෙන්ම ගතද උනුසුම් වී ගෙන එන බවක් වීරවංශට දැනිනි.

වීරවංශ තමා දෙසම බලා සිටිනවා දුටු තරුණිය ආකර්ෂණීය සිනහාවකින් ඔහුට සංග්‍රහ කලාය. මෙතෙක් වේලා තමාට නොදැනුනු හද ගැස්ම ඇගේ සිනහවෙන් පසු ඔහුටම ඇසෙන්නට

**වීරවංශට ශ්‍රියාලතා මතක්වුනි. ශ්‍රියාලතාගේ කෙසඟ සිරුර, නොවැඩුනු පයෝදර, වක්වූ නාශය, ඔහුගේ සිහියට එයි. ශ්‍රියාලතා වගේද මේ කෙල්ල. ඔහු හිත හදාගත්තේය. "බල්ලොත් නොකන සල්ලි." වීරවංශට සිතිනි. ඔහු ත්‍රීවිලය දෙසට පය ඔසවන්න විය. ඔහු ත්‍රීවිලය වෙත ගොස් එහි හිඳගත්තේය. ඔහු එහි තුල සිටම තරුණිය දෙස බැලුවේය. ඈද ත්‍රීවිලරය දෙසට එමින් උන්නාය. එක් වරම ප්‍රාඩෝ රියක් වේගයෙන් පැමින ඇය එන මඟ හරස් කොට නැවැත්වූවේය. ඒ සමගම රිය නැවැතත් වේගයෙන් ඉගිලී ගියේය. ඔහු ඇය ආ මාවත දෙස නැවතත් හැරී බැලීය. එහෙත් ඇය නැත. ඔහු පුදුමයෙන් මෙන් ත්‍රීවීලර් රියදුරා දෙස බැලුවේය.**

විය.

හුඟ වෙලාවකින් බස් එකක් ගියෙ නැද්ද ?

තරුණිය ඔහුගේ දෑස් දෙසම බලාගෙන ප්‍රශ්න කලාය.

නෑ.



# නොනිමි

වීරවංශ පිලිතුරු දුන්නේය. තමගේ පිළිතුර කෙටි වැඩියැයි ඔහුගේ සිතට වැටහුනි. ඔහු ඉමහත් ආයාසයකින් ප්‍රශ්නයක් සිතට ගොනු කරගත්තේය.

ඔයා කොහාටද යන්නෙ ?

ඇය වීරවංශ දෙසට හැරී සිනාවක් පා එක් ඇසක් වසා ඉඟිකොට

කොහාට හරි කමක් නෑ.

යනුවෙන් පවසා වීරවංශ දෙස බලා සිටියාය. තමා ඉමහත් නොසන්සුන් බවකින් පෙලෙන බව වීරවංශට වැටහුනි.

මී ලඟට තමා කුමක් කල යුතුද යන්න පිලිබඳවවත් වැටහීමක් ඔහු තුල නොතිබිනි. තරුණිය එය වටහා ගත්තාක් මෙන් ඔහු අසලට පැමිණියාය.

ලග තැනක් තියෙනවා. කාමරයට රුපියල් අටසීයයි. මගේ ගාන දෙදාහයි. සේරම තුන්දාහක් වෙයි. ඔයා කැමතිද ?

වීරවංශ කල්පනාවට වැටුනේය. රුපියල් තුන්දාහක් ? කජු ඇටද කොස් ඇටද ? ඒත් මේ වගේ කෙල්ලෙක් එක්ක මොහොතක් ඉන්න ලැබෙනවානම් තුන්දාහක් ගානක්ද ? ඔහු නැවතත් තරුණිය දෙස බැලුවේය. "ෂා මේකි නං ඉටි රූපයක්ම තමයි."

වීරවංශ තමාටම කියා ගත්තේය.

මොකද මහත්තයා ගාන වැඩිද ?

ඒ හඬට වීරවංශ ගැස්සී ගියේය. ඔහු ගැස්සී ගිය තාලයට තරුණියටද සිනා ගියේය. ඇයගේ සිනාව දෙස ඔහු ආසාවෙන් බලා සිටියේය. ඇය නැවතත් තම කටහඬ අවදි කලාය. මෙතන වැඩි වෙලා ඉන්නත් බෑ. මහත්තයා කැමතිනං අර ඉස්සරහ තියෙන ත්‍රීවීලර් එකට නගින්න. මං පස්සෙ එන්නම්.

වීරවංශට ශ්‍රියාලතා මතක්වුනි. ශ්‍රියාලතාගේ කෙසඟ සිරුර, නොවැඩුනු පයෝදර, වක්වූ නාශය, ඔහුගේ සිහියට එයි. ශ්‍රියාලතා වගේද මේ කෙල්ල. ඔහු හිත හදාගත්තේය. "බල්ලොත් නොකන සල්ලි." වීරවංශට සිතිනි. ඔහු ත්‍රීවිලය දෙසට පය ඔසවන්න විය. ඔහු ත්‍රීවිලය වෙත ගොස් එහි හිඳගත්තේය. ඔහු එහි තුල සිටම තරුණිය දෙස බැලුවේය. ඈද ත්‍රීවිලරය දෙසට එමින් උන්නාය. එක් වරම ප්‍රාඩෝ රියක් වේගයෙන් පැමින ඇය එන මඟ හරස් කොට නැවැත්වූවේය. ඒ සමගම රිය නැවැතත් වේගයෙන් ඉගිලී ගියේය. ඔහු ඇය ආ මාවත දෙස නැවතත් හැරී බැලීය. එහෙත් ඇය නැත. ඔහු පුදුමයෙන් මෙන් ත්‍රීවීලර් රියදුරා දෙස බැලුවේය.

ඕවා ඔහොම තමයි සර්. අද ඔය කෙල්ල අරුන්දගෙන් හොද ගානක් කපා ගනීයි. දුප්පත් කෙල්ලොනේ සර්. මම දන්න හොඳ තැනක් තියෙනවා එතනට ආටා එක අල්ලන්ද ?

එපා මල්ලි බොහොම ස්තූතියි.

වීරවංශ ඉක්මනින් ත්‍රිවීලරයෙන් බැස ගත්තේය. ඔහුගේ සිතට මහත් සහැල්ලුවක් දැනිනි. ඔහු ගැඹුරු හුස්මක් ගෙන සෙමෙන් පිට කර හැරියේය. අධික පීඩනයකින් තමා නිදහස් වූ බවක් ඔහුට හැඟිනි. එකවරම ඔහුට යමක් මතක් වූවාසේ ලහිලහියේම නගරය වෙත යාමට පටන් ගත්තේය. එකවරම අසල තිබූ සාප්පුවක් වෙත රිංගූ වීරවංශ ශ්‍රියාලතාට සාරියක් මිලදී ගත්තේය. තවත් අඩුම කුඩුම රැසක් මිලදී ගත් වීරවංශ මිටෙන් හල කුරුල්ලෙකු මෙන් නිවස බලා පියෑඹීය.

හේමලාල් විද්‍යාරත්න
දුම්රිය ස්ථානාධිපති
රොසැල්ල
lalvidya@yahoo.com

Computers......... Computers........Computers

ඔබ වෙනුවෙන්ම කඩිනම් විශ්වාසදායී පරිගණක සේවයක්

Call Prasanna
0433 019 773
psscomputers@gmail.com
24, Brushwood Circuit
Roxburgh park
Vic - 3064

- Computer Repairs and Upgrade
- Virus and Spyware Removal
- Internet & Networking Services
- Web Design, Database Programming
- Custom Built GPS System
- Software Tutoring
- Free Pick-up and Delivery

Qality Service Garanteed

Free quotation for Computer Assembling



PSS Computers
0433 019 773

All Sort of Desktop-Laptop-Server Repairing